(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා**

## 2015 නොවැම්බර් මස 20 වැනි සිකුරාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2015 නොවැම්බර් මස 21 වැනි සෙනසුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/’15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂය තුළ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් රු.39,061,290.12 ක වටිනාකමකින් යුත් කැරම් බෝඩ් 14,000ක් සහ දාම් බෝඩ් 14,000ක් බෙදාදීම ක්‍රීඩා අමාත්‍යාංශයේ 2014 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත වී තිබුණේද;

(ii) පාර්ලිමේන්තුව විසින් 2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තු යටතේ එම කැරම් බෝඩ් සහ දාම් බෝඩ් මිලදී ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයට ප්‍රතිපාදන වෙන් කොට දී තිබුණේද; සහ

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සතොස මඟින් මිලදී ගත් මෙම භාණ්ඩ අමාත්‍යාංශයේ ගබඩාවලට විධිමත් පරිදි භාරගෙන තිබේද;

(ii) අමාත්‍යාංශයේ ගබඩාවලට භාර ගෙන නොමැති නම්, එම භාණ්ඩ භාර ගත් නිලධාරීන් සහ ආයතන කවරේද; සහ

(iii) එම භාණ්ඩ බෙදා හැර ඇති ස්ථාන හා ඉතිරි භාණ්ඩ ගබඩා කර ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ප්‍රසම්පාදන පටිපාටීන්ගෙන් තොරව හිටපු ක්‍රීඩා අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි මිලදී ගෙන, එහෙත් අමාත්‍යාංශය වෙත නොලැබුණු ක්‍රීඩා භාණ්ඩ පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් පවත්වනු ලබන විමර්ශනයේ ප්‍රගතිය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් වගකිවයුත්තන් කවුරුන්ද; සහ

(iii) ඊට අදාළව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

19/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2011 - 2014 අතර කාලය තුළ සමූපකාර සංවර්ධන අරමුදල හා සමූපකාර අතිරික්ත අරමුදලේ රුපියල් මිලියන 897.06ක්, 1972 සමූපකාර සමිති පනතේ දැක්වෙන ප්‍රතිපාදනවලට පටහැනිව අවභාවිතා කිරීම සහ සාවද්‍ය පරිහරණයට ඉඩහැරීම යන චෝදනා යටතේ හිටපු අමාත්‍යවරයාට හා හිටපු සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාට එරෙහිව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාශය වෙත පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වන පැමිණිල්ලේ විමර්ශනවල ප්‍රගතිය කවරේද; සහ

(ii) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව පොදු දේපළ පනත යටතේ විමර්ශනයක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව ආයතනික මට්ටමින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) අහිමි වූ මුදල් යළි අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද; සහ

(iii) විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පොදුවේ රාජ්‍ය අරමුදල් අවභාවිතය වැළැක්වීම සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

22/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 සංශෝධිත අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් ගරු මුදල් අමාත්‍යතුමා පාර්ලිමේන්තුව අමතා පැවැත්වූ දේශනයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මෙතෙක් ලබාදුන් විමධ්‍යගත ප්‍රතිපාදනය වූ රුපියල් ලක්ෂ 50 වෙනුවට රුපියල් ලක්ෂ 100ක් ලබාදෙන බවට ප්‍රතිඥා දුන් අතර, අග්‍රාමාත්‍යතුමන්ද එය ගරු සභාවට තහවුරු කරන ලද නමුත්, 2015 වසර සඳහා 2015 සැප්තැම්බර් 10 වැනි දින දක්වා කිසිදු මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත ප්‍රතිපාදන ලබාදී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙතෙක් ඉතිහාසය පුරා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට හිමිවූ රුපියල් ලක්ෂ 50ක මුදල හෝ අවම වශයෙන් මෙම වසරේ ඉදිරි මාස කිහිපය තුළ දී ලබාදීමට කටයුතු කරන්නේද; සහ

(ii) නොඑසේ නම්, අඛණ්ඩව දශක හතරකට වැඩි කාලයක් පුරා මහජන මන්ත්‍රීවරයකු භුක්තිවිඳි වරප්‍රසාදයක් වත්මන් රජය විසින් කඩකිරීමක් ලෙස පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සබරගමුව පළාතේ, ඉතා වැදගත් බෞද්ධ සිද්ධස්ථානයක් වන කූරගල ඓතිහාසික පුදබිම තුළ කැණීම් කටයුතු සිදු කිරීම නවතා තිබේද; සහ

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කූරගල පූජා භූමියට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙහි සීමා නිර්ණය කර තිබේද;

(iii) කැණීම් මගින් ලබා ගත් පුරා වස්තු රැක ගැනීමට පියවර ගෙන තිබේද; සහ

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කූරගල පූජා භූමියේ බෞද්ධ අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එහි කැණීම් අඛණ්ඩව කිරීමට අවශ්‍ය පියවර ගන්නේද; සහ

(iii) එසේ නම්, ඒ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

79/'15

ගරු චන්දිම ගමගේ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වසර පහක පමණ කාලයක සිට අලි - මිනිස් ගැටුම උග්‍ර අතට හැරුණු අතර එමගින් අදටත් මිනිස් ජීවිත මෙන්ම අලි සම්පත ද විනාශ වෙමින් පවතින බවත්; සහ

(ii) අවිධිමත්ව හා සැලසුමකින් තොරව විදුලි වැටවල් ඉදිකිරීම තුළින් වන අලින්ගෙන් ගම්මාන ආරක්ෂා වීම වෙනුවට අසාධාරණ ලෙස තමන්ගේ ඉඩකඩම් හා ගේ දොර අහිමිවීමෙන් ගම්මානවල ජීවත්වන ජනතාව අසරණ භාවයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලයේදී ඉදිකල හා ඉදිකිරීමට යෝජිත විදුලි වැට ව්‍යාපෘති ගණන කොපමණද;

(ii) විදුලි වැට ඉදිකර ඇති දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට අක්‍රියව ඇති විදුලි වැටවල් සංඛ්‍යාව කොපමණද; සහ

(iv) ඉහත (අ) (ii)හි සඳහන් සිද්ධීන්වලට මුහුණ දුන් ජනතාවට සාධාරණය ඉටු කිරීම පිණිස හා එවැනි පැමිණිලි භාර ගැනීමට නිසි ක්‍රමවේදයක් අමාත්‍යාංශය තුළ ස්ථාපනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

93/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී තමන් ජීවත්වන වාසස්ථානයට හිමිකම් පෙන්වන ඔප්පුවක් නොමැතිකම මත පමණක්ම සම්මුඛ පරීක්ෂණයට පවා නොකැඳවුනු අවස්ථා තිබෙන බවත්; සහ

(ii) පසුගිය ආණ්ඩු සමයේ ඔප්පු නැතිකම මතම පමණක් පාසලට ඇතුළත්කර නොගත්තා වූ දරුවන් සම්බන්ධයෙන් වෙනම අභියාචන කමිටුවක් පත්කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී පදිංචිය සනාථ කිරීම සඳහා පදිංචිකරුවන් විසින් අදාළ ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කළයුතු බවට නීතියක් තිබේද;

(ii) ඔප්පු නොමැතිකම මතම පමණක්, පාසල්වලට අද දක්වා ඇතුළත් කර නොගත් දරු දැරියන් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) හිමිකම් ඇති නැති බව නොසලකා පදිංචිය සනාථ වේ නම්, එය සුදුසුකම ලෙස සාධාරණව නිරාකරණය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

165/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1977 සිට දීර්ඝ කාලයක් උඩුනුවර මැතිවරණ බලප්‍රදේශය පුරා යටිනුවර ඩිපෝව මඟින් ක්‍රමවත් බස්රථ සේවාවක් උඩුනුවර මගී ජනතාවගේ පහසුව සඳහා යොදා තිබූ බවත්; සහ

(ii) ප්‍රාදේශීය මට්ටමින් ඩිපෝ පවත්වාගෙන යමින් ප්‍රදේශයේ මගී ජනතාවට පහසුකම් සැලසීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුණ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් කාලය තුළ බස්රථ ධාවනය කළ මාර්ග හා මාර්ග අංක කවරේද;

(ii) එම මාර්ගවලින් යටිනුවර ඩිපෝව මඟින් මේ වනවිට බස්රථ ධාවනය නොකරන මාර්ග කවරේද; සහ

(iii) දැනට බස්රථ ධාවනය කරන මාර්ග, මාර්ග අංක හා වේලාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට යටිනුවර ඩිපෝව මඟින් ධාවනය නතර කර ඇති කලින් බස්රථ ධාවනය කළ මාර්ගවල යළි බස්රථ ධාවනය කරලීමට කටයුතු කරන්නේද; සහ

(ii) එසේනම්, ඒ කවර දිනක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

178/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එම්. එම්. ඒ. නිෆ්රාන් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් පදිංචිව සිටි දික්වැල්ල, යෝනකපුර, වෙදගෙදර, අංක 264/1 දරන නිවස, කඳු ආශ්‍රිත ප්‍රදේශයක පිහිටා තිබූ බවත්;

(ii) 2012.09.22 දින ඇද හැලුනු වර්ෂාව නිසා කැඩී බිඳී ගිය එම නිවසෙහි ඉතිරිව තිබූ මුළුතැන්ගෙයද, 2015.09.02 දින අලුයම 1.45ට පමණ යාබද පස් කඳු නාය යාම නිසා සම්පූර්ණයෙන්ම විනාශයට පත් වී ඇති බවත්; සහ

(iii) මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ වගකිව යුතු නිලධාරීන් දැනුවත් කළද මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කුඩා දරුවන් හා බිරිඳ සමග පවුලක් ලෙස ජීවත්වීමට තිබූ එම නිවස සම්පූර්ණයෙන් කැඩී බිඳී යෑමෙන් සහ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිකමින් අසරණභාවයට පත්ව සිටින නිෆ්රාන් මහතාට එම නිවස ඉදිකර දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

30/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) මෙම මුදල වැය කළ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) එම වැඩසටහන් මඟින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා එවකට පැවති තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සිදු කරන ලද කටයුතු කවරේද;

(ii) 2014 වර්ෂයේදී ඉදිරිපත් වූ නව නිපැයුම් කවරේද;

(iii) එම නව නිපැයුම් ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද; සහ

(iv) ඔවුන්ට ලබා දුන් අනුග්‍රහයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල වැඩි කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, වැඩි කිරීමට අපේක්ෂිත මුදල කොපමණද; සහ

(iii) එම මුදල වැය කිරීමට ඇති සැලසුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් සිල් රෙදි ඇතුළු විවිධ ද්‍රව්‍ය ඡන්ද දායකයාට බෙදාදීම සඳහා රුපියල් මිලියන 600 ක රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එවකට සභාපති වූ, හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා සහ එවකට අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට යන අයට එරෙහිව ගෙන ඇති ආයතනික ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් සිදුකරනු ලබන මූල්‍ය අපරාධ විමර්ශනයන්ගේ වර්තමාන තත්ත්වය කවරේද; සහ

(iii) මහා පරිමාණ මූල්‍ය අපරාධයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අදාළ වගකිවයුතු බලධාරීන් මැලි වන්නේ නම්, ඔවුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයට අහිමි වූ රුපියල් මිලියන 600 ක මුදල අයකර ගැනීම සඳහා විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) විදුලි සංදේශ නියාමන කොමිසමේ මුදල් උපයෝගී කර ගනිමින් සිල් රෙදි බෙදා දීම හැරුණු විට 2015 ජනාධිපතිවරණයට අදාළව සිදුකරන ලද අනෙකුත් රාජ්‍ය මූල්‍ය අවභාවිතයන් කවරේද; සහ

(iii) ඊට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අද වනවිට විදේශ රටවල අත්අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද; සහ

(ii) ඔවුන් අත්අඩංගුවේ පසුවන රටවල් හා එක් එක් රටේ සිටින ධීවරයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අත්අඩංගුවේ පසුවන එක් එක් ධීවරයාගේ නම, ලිපිනය, දුරකථන අංකය හා අත් අඩංගුවේ පසුවන කාල සීමාව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) අත්අඩංගුවට පත්වන ධීවරයන් කඩිනමින් මුදා ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) ධීවරයන් මුහුදු සීමා උල්ලංඝනය කිරීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අත්අඩංගුවට පත් ධීවරයන් නිදහස් වූ පසු තම රැකියාව නැවත ආරම්භ කිරීම සඳහා සහාය ලබා දෙන්නේද; සහ

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 නොවැම්බර් මස 23 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

14/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් හිටපු විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත දිවිනැගුම අරමුදල් උපයෝගී කර ගනිමින් රුපියල් 20,132,277/- ක (මිලියන 20.1) GI පයිප්ප බට (කොඩිකනු) මිලදී ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවිනැගුම අරමුදලේ අරමුණු අනුව ප්‍රාදේශීය සභා සඳහා GI පයිප්ප බට මිලදී ගෙන බෙදා දීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, දිවිනැගුම පනතේ කවර වගන්තියක් යටතේද; සහ

(iii) ඒ සඳහා අනුමතිය ලබා දී ඇති බලධාරියා කවුද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙසේ මූල්‍ය අවභාවිතය තුළින් අහිමි වූ රුපියල් මිලියන 20 ක මුදල අයකර ගැනීම සඳහා වර්තමාන අමාත්‍යවරයා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ සම්බන්ධ මූල්‍ය අපරාධ විමර්ශනයක් සිදු වන්නේද;

(iii) එසේ නම්, එම විමර්ශනයෙහි ප්‍රගතිය කවරේද; සහ

(iv) මේ සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

20/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය සම්පත් අවභාවිත කිරීම පිළිබඳව විගණකාධිපති විසින් 2015 ජුනි මස 10 වන දින අංක IS/INV/PC/GDE/2015/04 දරන විගණන විමසුම මගින් අනාවරණය කරගෙන ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වන මූල්‍ය විෂමාචාරයන් කවරේද;

(ii) එම විෂමාචාරයන්ගේ වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විගණන විමසුමෙන් හෙළිදරව් කර ඇති එම මූල්‍ය විෂමාචාරයන්ට අදාළව අමාත්‍යාංශය මගින් විමර්ශනයක් ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, එහි වත්මන් ප්‍රගතිය කවරේද; සහ

(v) හෙළිදරව් කර ඇති මූල්‍ය අපරාධ සම්බන්ධව පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ආරම්භ කර ඇති විමර්ශනයේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

24/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු පළාත් සභාවට අයත් කාපට් ඇතිරීම සඳහා මූලික සූදානම් කිරීම් කළ මහාමාර්ග 18ක වැඩ 2015 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අතරමග නවතා දමා ඇති බවත්; සහ

(ii) කැකණඳුර සිට වෙහැල්ල හරහා දික්වැල්ල දක්වා වූ මාර්ගය ප්‍රවාහනයට තබා ඇවිදයාමටද පවා අපහසු අයුරින් අබලන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් අළුත්වැඩියා කටයුතු අතරමග නවතා දමා ඇති මාර්ග 18 කවරේද;

(ii) ඉහත (අ) (ii)හි සඳහන් මාර්ගයෙහි කාපට් ඇතිරීම සිදුකරන දිනය කවරේද;

(iii) මහා භාණ්ඩාගාරය විසින් මෙම මහාමාර්ග සඳහා වෙන්කොට ඇති හෝ වෙන්කරන බවට පොරොන්දු වී ඇති මුදල කොපමණද; සහ

(iv) ඒ අනුව, මෙම මහාමාර්ගයන්හි කාපට් ඇතිරීම සඳහා වූ ඉදිරි වැඩපිළිවෙළ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ සිටින සිංහල ජනගහනය කොපමණද; සහ

(ii) එම ජනතාව පදිංචිව සිටින ගම්මාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, සිංහල ගම්මානයන්හි වෙසෙන ජනතාවට නිවාස, ජලය ඇතුළු මූලික පහසුකම් ප්‍රමාණවත් පරිදි නොලැබෙන බවත්;

(ii) එම ජනතාවගෙන් බහුතරයකට රජයේ සේවාවන් නිසි පරිදි නොලැබෙන බවත්; සහ

(iii) එම ජනතාව තම ගම්වලින් ඉවත් කිරීමට ඇතැමුන් කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙසෙන සිංහල ජනතාවට අවශ්‍ය නිවාස, ජලය ඇතුළු මූලික පහසුකම් ලබාදීමට ගන්නා පියවර කවරේද;

(ii) එම ජනතාවට තම ගම්බිම්හි අයිතිය තහවුරු කර දීමට ගන්නා පියවර කවරේද;

(iii) යුද්ධය නිසා මඩකලපුවේ ගම්බිම් අතහැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූ සිංහල ජනතාව නැවත ඔවුන්ගේ පැරණි ගම්බිම් වෙත ගෙන ඒමට කටයුතු කරන්නේද; සහ

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

80/'15

ගරු චන්දිම ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය දශකයක පමණ කාලය තුළ පුරාවස්තූන් හා නිදන් වස්තූන් බරපතල ලෙස විනාශවීම් හා සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම් පිළිබඳව විවිධ මාධ්‍ය මඟින් වාර්තාකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) මාධ්‍ය මඟින් වාර්තා වූ සිද්ධීන් හා ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් හා පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නීතිමය ක්‍රියාමාර්ග තුළින් වැරදිකරුවන් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; සහ

(v) මෙවැනි සිද්ධීන් යළි ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

160/'15

ගරු තාරක බාලසූරිය මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සහතික මිලට වී මිලදී ගන්නා දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්ක කවරේද;

(iii) අනිකුත් දිස්ත්‍රික්කවල ගොවීන්ට තම නිෂ්පාදන රජයේ සහතික මිලට අලෙවි කර ගැනීමට ක්‍රමවේදයක් ඇතිකර තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජයේ සහතික මිලට වී මිලදී ගන්නා දිස්ත්‍රික්කයක් ලෙස අනුමත කර නොමැති දිස්ත්‍රික්කවල අවම වශයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට වී මිලදී ගැනීමේ නියෝජිත ධුරයක් ලබා දීමට කටයුතු කළ හැකිද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

164/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී සිටි, ශ්‍රී ලංකා යුද හමුදා සෙබළු විශාල සංඛ්‍යාවක් වසර 12ක් යුද හමුදාවේ සේවය කර හමුදා සේවයෙන් ඉවත්ව සිටින බවත්; සහ

(ii) ඔවුන් මේ වනවිට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යුද හමුදාවේ වසර 12ක් සේවය කර හමුදා සේවයෙන් ඉවත්වී සිටින සෙබළුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට සහනයක් සැලසීමට කටයුතු කරන්නේද;

(iii) රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ එම පිරිසට අර්ධ විශ්‍රාම වැටුපක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද; සහ

(iv) එසේ නම්, එම අර්ධ විශ්‍රාම වැටුප ලබා දීමට කටයුතු සලසන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

176/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1986 දී අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිකරුවන් අතරින් මහවැලි "බී" කලාපයේ, සේනපුර ගම්මානයේ පදිංචි කරන ලද පවුල් 38ක් පමණ, 1992.04.14 දින අලිංචිපොතාන ප්‍රදේශයට කොටි ත්‍රස්තවාදීන් විසින් ප්‍රහාර එල්ල කිරීම නිසා ජීවිත ආරක්ෂාව පිණිස ප්‍රදේශයෙන් ඉවත් වූ බවත්; සහ

(ii) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ සංවර්ධනය නොකරන ලද ඉඩම් අවලංගු කිරීමේදී එම ඉඩම් ඔවුන්ට අහිමි වූ අතර පදිංචිය සඳහා පමණක් ගොඩ ඉඩම් ලබාදීම වෙනුවෙන් 2013.08.02 දින පරීක්ෂණයක් පවත්වන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත පරීක්ෂණ කටයුතුවල ප්‍රගතිය කවරේද; සහ

(ii) මේ වනවිට පදිංචිය සඳහා ඉඩම් කට්ටි ලබාදීමට තෝරාගෙන ඇති පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

179/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශිෂ්‍යයින් 600 ආසන්න සංඛ්‍යාවක් ඉගෙනුම ලබන පුත්තලම දිස්ත්‍රික්කයේ පු/කල්/පුලංචිවේන මුස්ලිම් මහ විදුහලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා ගොඩනැගිලි පහසුකම් නොමැති වීම අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යැමට බාධාවක් වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසැලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ගේ පහසුව පිණිස 60'x25' ප්‍රමාණයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරදීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂය තුළ දී සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ සමාගම කවරේද;

(iii) එම සමාගම වෙත අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iv) එසේ නම්, එම සමාගම ඉදිරිපත් කළ ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(v) ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් සමාගම් කවරේද; සහ

(vi) එම සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක, අයත් රට හා ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත සමාගම සඳහා ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද; සහ

(ii) එම සමාගම සමග කටයුතු කිරීමෙන් රජයට අලාභයක් සිදුවී ඇති බව එතුමා දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

87/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රක්නා ආරක්ෂණ ලංකා සමාගම ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් බව පිළිගන්නේද; සහ

(ii) එසේ නම්, එය පිහිටවූ වර්ෂය සහ එකී වර්ෂයේ සිට 2015 දක්වා සමාගමේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාගම විසින් ආරක්ෂක සේවාව ලබා දුන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන කවරේද; සහ

(ii) එකී ආයතන සමග ආරක්ෂාව සැපයීම සඳහා ගිවිසුම් ගත වූ වර්ෂය, දිනය හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2015 ජනවාරි සිට අද දක්වා කාලය තුළ මෙම සමාගම සේවා සැපයීමෙන් ඉවත් කොට ඇති රාජ්‍ය ආයතන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) එලෙස ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) ඒ වෙනුවට උපයෝගී කරගෙන ඇති ආරක්ෂක සමාගම් කවරේද; සහ

(v) එම ආදේශිත සමාගම්වල අධ්‍යක්ෂකවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම සමාගම විසින් ආරම්භයේ සිට වාර්ෂිකව උපයා ගෙන ඇති ආදායම සහ ලාභය කොපමණද; සහ

(ii) මහා භාණ්ඩාගාරයට වාර්ෂිකව ලබාදී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 වර්ෂය තුළදී ගුරුවරුන්ගේ පහර දීම් ඇතුළු හිංසනයන් මෙන්ම, අපචාර නිසා පීඩාවට ලක් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් එක් එක් ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නම, ලිපිනය හා ඉගෙනුම ලබන පාසල;

(ii) එම එක් එක් ශිෂ්‍යයාට හෝ ශිෂ්‍යාවට සිදු කර ඇති පීඩාව;

(iii) පීඩාවට පත් එක් එක් ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග;

(iv) ඉහත එක් එක් සිදුවීමට සම්බන්ධ ගුරුවරුවරයාගේ නම, ලිපිනය හා පාසල; සහ

(v) එකී එක් එක් ගුරුවරයාට එරෙහිව ගත් ක්‍රියාමාර්ග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ගුරුවරුන්ගෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිදුවන අමානුෂික පීඩාවන් වැළැක්වීමට පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ආධාර මත පවත්වාගෙන යනු ලබන ආගමික සංවිධාන යටතේ පාලනය වන අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ආගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත අධ්‍යාපන ආයතනයන්හි නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත, (අ) (iii) හි සඳහන් අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ සංයුතිය කවරේද; සහ

(iii) උක්ත ආයතනයන්ට රජය වර්ෂයකට වැය කරන මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

163/'15

ගරු චන්දිම ගමගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තම වගා බිම් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවි ජනතාවට ගිනි අවි ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මෙලෙස නිකුත් කර ඇති ගිනි අවි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අනුව ගිනි අවි ලබා ගෙන ඇති සියල්ලන්ම අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේද; සහ

(iv) නොඑසේ නම්, ඔවුන්ට ගිනි අවි නිකුත් කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුදුසුකම් සපුරා ඇති සියල්ලන්ටම කිසිදු බාධාවකින් තොරව නිසි බලධාරීන් හමුවී ගිනි අවියක් ලබා ගැනීමේ හැකියාවක් තිබේද; සහ

(ii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

166/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතන භූමියේ මහින්ද රාජපක්ෂ රඟහල නමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබෙන බවත්;

(ii) එම ගොඩනැගිල්ල විවෘත කර දීර්ඝ කාලයක් ගතවී ඇතත්, නිසි අයුරින් ප්‍රයෝජනයට ගැනීමක් සිදු නොවන බවත්;

(iii) අධික මුදලක් අයකරන බැවින් මෙම රඟහලේ ප්‍රසංග පැවැත්වීමට ප්‍රසංගකරුවන්ට හා කලාකරුවන්ට අවස්ථාවක් නොලැබෙන බවත්; සහ

(iv) මේ හේතුවෙන් ඔවුන්ට දැඩි අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රජය මඟින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එය විවෘත කළ දිනය කවරේද;

(iii) මේ වනවිට මෙම රඟහලේ පවත්වා ඇති ප්‍රසංග සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රසංගයන් කවරේද;

(v) මෙම රඟහලේ ප්‍රසංගයක් පැවැත්වීම සඳහා දිනකට අය කරනු ලබන මුදල කොපමණද;

(vi) ඒ සඳහා ලබාදෙන කාලය කොපමණද;

(vii) මේ වනවිට මෙම රඟහලේ පවත්වන ලද ප්‍රසංග වලින් ලබා ඇති මුළු ආදායම කොපමණද;

(viii) ප්‍රසංගකරුවන්ට සහ කලාකරුවන්ට සාධාරණ මිලකට මෙම රඟහලෙහි ප්‍රසංග පැවැත්වීම සඳහා අවස්ථාව සලසා දීමට පියවර ගන්නේද; සහ

(ix) එසේ නම්, ඒ කවර දිනක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

171/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති රාශියක් 2015 ජනවාරි මස සිට නතරකර දමා ඇති බවත්; සහ

(ii) මෙම වසර තුළ පැවැත්වූ එකම දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී ඒවා නැවත ආරම්භ කරන බව රජයේ දේශපාලනඥයින් හා නිලධාරීන් අවධාරණය කරනු ලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යෝජිත ස්ථානයෙහි, මාතර නව නගර සැලැස්ම ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

(iv) මාතර නව නගර ශාලා සංකීර්ණය ඉදිකිරීම් ආරම්භ කරන්නේද;

(v) එසේ නම්, ඒ කවර දිනයකදීද; සහ

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

177/’15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි ව්‍යසනය නිසා නිවාස අහිමිවූවන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන්, අම්පාර දිසාපති/දිස්ත්‍රික් ලේකම් දැනුවත් කරන ලද ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010.09.30 දිනැති අංක SD/8/2 ලිපිය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2010.11.02 දිනැති අංක MNBD/06/AD/CO/16 ලිපිය සහ ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ 2010.09.23 දිනැති අංක MDM/AS/DM/46 ලිපිය යන ලිපි පිළිබඳව ගනු ලැබූ පියවර කවරේද; සහ

(ii) ඒවායේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනය නිසා අම්පාර දිස්ත්‍රික්කයේ, සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස අහිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද; සහ

(iii) නිවාස අහිමිවූවන් අතරින් මේ වනවිට ස්ථිර නිවාස ලබාදී ඇති පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

54/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය පරිශ්‍රය තුළ සීනි සේදීමේ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමට රජය අවසර දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම හා විදේශීය ආයතනයක් නම්, එම රට කවරේද; සහ

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම ආයෝජනය කරනු ලබන මුදල කොපමණද;

(ii) රජය විසින් එම සමාගමට ලබා දෙන සහන කවරේද;

(iii) සීනි සේදීමේ කර්මාන්තශාලාව ආරම්භ කිරීම මඟින් මෙරටට සැලසෙන වාසි කවරේද; සහ

(iv) මෙම කර්මාන්තශාලාව මඟින් වසරකට පිරිපහදු කිරීමට බලාපොරොත්තු වන සීනි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්තශාලාව නිසා ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය බිඳවැටීම වළක්වා ගැනීමට රජය පියවර ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

55/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික පාසල් දරුවන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වී ඇති බවත්; සහ

(ii) මෙම ජාවාරම් පාසල් දරුවන් යොදාගෙන සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මත්ද්‍රව්‍යයන් පාසල් තුළට පිවිසීම නැවැත්වීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද; සහ

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර පහ තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් පාසල් ශිෂ්‍යයන් ප්‍රමාණය කොපමණද;

(ii) ඔවුන් නැවත සමාජගත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාදාමය කවරේද;

(iii) එසේ සමාජගත කළ දරුවන් පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන්නේද; සහ

(iv) එසේ නම්, එම ක්‍රියාවලියට සම්බන්ධ පියවරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

167/’15

ගරු ලකී ජයවර්ධන මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1977 දී එවකට නිවාස අමාත්‍යවරයා වූ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් අනුව මධ්‍යම පාන්තිකයන් වෙනුවෙන් මහනුවර හන්තාන ප්‍රදේශයේ නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස සංවර්ධන අධිකාරියට අයත් එම යෝජනා ක්‍රමයේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සියලුම නිවාස පදිංචිකරුවන්ට ලබාදී තිබේද; සහ

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට එම භූමිය තුල අධිකාරියට අයත් හිස් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය රජයේ නිවාස අමාත්‍යවරයා විසින් මෙම භූමියේ සුපිරි නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් විකුණා තිබේද;

(iv) එසේ නම්, ඒ කා හටද; සහ එසේ විකුණු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩම් විකිණීමෙන් අධිකාරිය ලැබූ ආදායම කොපමණද;

(vi) මේ වනවිට එම ඉඩම්වල සුපිරි නිවාස ඉදිකර තිබේද;

(vii) එසේ නම්, ඒවායේ විකුණුම් මිල කොපමණද;

(viii) අධිකාරිය ලැබූ ප්‍රතිලාභයන් කවරේද;

(ix) නිවාස ඉදිකර නොමැතිනම්, එම ඉඩම් යළි අධිකාරියට පවරා ගන්නේද; සහ

(x) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

172/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011.03.29 දිනැති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා තීරණයට අනුව, රැකියා විරහිත පුහුණු ගුරුවරුන් රජයේ පාසල්වලට පත්කිරීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විධිමත් සම්මුඛ පරීක්ෂණ පවත්වා, නාම ලේඛන 06ක්, 2011.05.03 දින රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවත්; සහ

(ii) එම ලේඛන 06න්, ලේඛන 04ක නම් සඳහන් පුද්ගලයින්ට පමණක්, පත්වීම් ලබා දීමට රේඛීය අමාත්‍යාංශය අනුමතිය ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉතිරි නාම ලේඛන 02හි නම් සඳහන් පුද්ගලයින්, රජයේ පාසල් ගුරුවරුන් වශයෙන් බඳවා ගන්නා දිනය එතුමා මෙම සභාවට දන්වා සිටින්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

180/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස අහිමි වී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගෙන, ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද; සහ

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 හා 2014 යන වර්ෂයන්හි උතුරු මැද පළාත් සභා මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන් සඳහා රජයේ වියදමින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම විදේශ සංචාර සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් ගණන හා ඔවුන්ගේ නම් කවරේද; සහ

(iii) එම මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරයන් සඳහා පළාත් සභාව වියදම් කළ මුදල එක් එක් මන්ත්‍රීවරයාට වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන්ට සහභාගී වූ හේතු කවරේද; සහ

(ii) එම සංචාරයන්ගෙන් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්ත්‍රීවරුන්ට අමතරව පළාත් සභාවේ වියදමින් වෙනත් පුද්ගලයින් විදේශ සංචාරයන්ට සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයින් විදේශගත වීමට හේතු කවරේද; සහ

(iv) එයින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියාව සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ට පුහුණුව ලබා දෙන මධ්‍යස්ථාන ගණන කොපමණද;

(ii) එම පුහුණුලාභීන්ට රජයෙන් ගෙවීමක් කරන්නේ නම්, එම මුදල කොපමණද; සහ

(iii) එම පුහුණුලාභීන් රජයට යම් මුදලක් ගෙවිය යුතු නම්, එම මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුලාභීන්ට ශ්‍රී ලංකාවේ හා ඔවුන් සේවයට යැමට බලාපොරොත්තු වන රටේ ආගමන විගමන නීති, රේගු නීති සහ විනිමය නීති පිළිබඳ දැනුමක් ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්නේද; සහ

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

168/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේ දේශපාලන හේතූන් මත, උඩුනුවර මැතිවරණ බලප්‍රදේශයේ දිවිනැගුම දීමනා නොලැබූ අඩු ආදායම්ලාභී පවුල් සිටින බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට කඩිනමින් එම දීමනා ලබාදීමට කටයුතු කරන්නේද; සහ

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උඩුනුවර මැතිවරණ බලප්‍රදේශය තුළ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මාසිකව දීමනා ලබාදෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබාදෙන දීමනාවල මුළු මාසික වටිනාකම කොපමණද;

(iii) මෙම දීමනා කාණ්ඩ වශයෙන් වෙන්කර තිබේද;

(iv) එසේ නම්, කාණ්ඩ අනුව එක් එක් අයට දීමනා ලබාදෙන ආකාරය කවරේද;

(v) එසේ කාණ්ඩ අනුව දීමනා ලබාගන්නා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2015 ජනවාරි 08 දින බිහිවූ යහපාලනය තුළ දිවිනැගුම දීමනාලාභීන් සඳහා දීමනා වැඩිකර තිබේද; සහ

(vii) එසේ නම්, ඒ එක් එක් අයට මාසිකව දීමනා වැඩිවූ ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ දිවිනැගුම දීමනා ලබන පවුල්වල නම්, ලිපිනයන් හා ඔවුන් ලබා ගන්නා දීමනා ප්‍රමාණයන්, ග්‍රාමසේවා කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහ සේවය සඳහා විදේශගතවන්නන් භාවිතයට නුසුදුසු සහ භාවිතයෙන් ඉවත් කළ භාණ්ඩ මෙරටට එවන බවත්;

(ii) ඒ සඳහා ඔවුන්ට විශාල මුදලක් වැය කිරීමට සිදුවන බවත්; සහ

(iii) මෙම අබලි ද්‍රව්‍ය අප රටේ පරිසරයට ද ප්‍රශ්නයක් විය හැකි බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) විදේශ රටවල සිට භාවිතා කරන ලද පැරණි ගෘහභාණ්ඩ ආදිය රට තුළට ඒම වැළැක්වීමට පියවර ගන්නේද; සහ

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

173/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ ක්‍රියාත්මක කරන ලද "ගමෙන් ගමට—දොරින් දොරට" ව්‍යාපෘතිය යටතේ වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන මගින්, මාතර මහ නගර සභා බලප්‍රදේශයේ, පරමුල්ල, බෙහෙත් ගබඩාව පාර බෝක්කුව සංවර්ධනය කිරීම සඳහා මාතර මහ නගර සභාව සමග මාතර, වල්ගම උතුර, කොටිකාගොඩ රජමහා විහාර පාරේ, අංක 112/3, එකමුතු ගොවි සංවිධානය සමග ගිවිසුම් ගත වූ බවත්; සහ

(ii) ලිපිගොනු අංක ම.ම.න.ස/නා.ඉ.දෙ/wc-3/2014– දො.දො - 04 ගිවිසුම් ප්‍රකාරව, 2014 නොවැම්බර් 17 දින ඉදිකිරීම ආරම්භකර 2014 දෙසැම්බර් වැඩ අවසන් කළ නමුත්, මෙතෙක් අදාළ කොන්ත්‍රාත් මුදල්, ගොවි සංවිධානය වෙත ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉදිකිරීම් අවසන් කර, ගෙවීම සඳහා බිල්පත් ද ඉදිරිපත් කර ඇති මෙම කොන්ත්‍රාත්තුවට අදාළ මුදල, වල්ගම උතුර එකමුතු ගොවි සංවිධානය වෙත මුදා හරින දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

63/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් අපද්‍රව්‍ය විශාල ලෙස මුදා හැර ඇති බවත්;

(ii) එම අපද්‍රව්‍ය වලින් කොටසක් පරිසරයටද අනාරක්ෂිත ලෙස මුදා හැර ඇති බවත්;

(iii) විද්‍යුත් අපද්‍රව්‍ය අනාරක්ෂිත ලෙස පරිසරට මුදා හැරීම පරිසර දූෂණයට ප්‍රධාන සාධකයක් වී ඇති බවත්; සහ

(iv) ජනතාවගේ සෞඛ්‍යයටද විද්‍යුත් අපද්‍රව්‍ය තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ වසරකට බැහැර කරනු ලබන විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද; සහ

(iv) මේ වනවිට එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විද්‍යුත් අපද්‍රව්‍ය මඟින් පරිසරයට මුදා හැරෙන රසායන ද්‍රව්‍ය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණය සිදු කළ ආයතනයේ නම සහ එම පරීක්ෂණය සිදු කළ දිනය කවරේද; සහ

(iii) නොඑසේ නම්, ඉදිරියේදී පරීක්ෂණ සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 28 වැනි සෙනසුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියන් සාගරයේ ජාත්‍යන්තර මුහුදු කලාපයේ මසුන් ඇල්ලීමට චීන යාත්‍රා වලට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) එම යාත්‍රා හා ශ්‍රී ලංකාව අතර ඇති ගිවිසුමට අදාළ බැඳීම් කවරේද; සහ

(iv) මෙලෙස අවසර ලබා දීම තුළින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර මුහුදේ මසුන් අල්ලන ශ්‍රී ලාංකික යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(ii) චීන යාත්‍රා හේතුවෙන් ශ්‍රී ලාංකික ධීවරයින්ට සිදුවන අසාධාරණ මැඩලීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) චීන යාත්‍රා සඳහා අවසර ලබාදීම වෙනුවට ශ්‍රී ලාංකිකයන්ට විශාල ධීවර යාත්‍රා ලබා ගැනීම සඳහා උපකාර නොකිරීමට හේතු කවරේද;

(iv) ශ්‍රී ලාංකිකයන්ට ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු කිරීම සඳහා විශාල ධීවර යාත්‍රා හා නවීන තාක්ෂණික මෙවලම් සමග අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර තිබේද; සහ

(v) එසේ නම්, ඒ කෙසේද; කවර දිනක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

169/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේ දේශපාලන හේතූන් මත, දිවිනැගුම දීමනා නොලැබූ අඩු ආදායම්ලාභී පවුල් සිටින බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට ඉතා කඩිනමින් එම දීමනා ලබාදීමට කටයුතු කරන්නේද; සහ

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා සිටින දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දීමනා ලබා දෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිසට ලබාදෙන දීමනාවන්ගේ මුළු මාසික වටිනාකම කොපමණද;

(iii) මෙම දීමනා ප්‍රමාණයන් කාණ්ඩ අනුව වෙන්කර තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් කාණ්ඩ අනුව එක් එක් අයට ලබාදෙන දීමනා ප්‍රමාණයන් කවරේද;

(v) දිවයිනෙහි කාණ්ඩ අනුව දීමනා ලබාගන්නා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2015 ජනවාරි 08 දින බිහිවූ යහපාලනය තුළ දිවිනැගුම දීමනාලාභීන් සඳහා දීමනා වැඩිකර තිබේද; සහ

(vii) එසේ නම්, වැඩි වූ දීමනා එක් එක් කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පුරා ගව කුර හා මුඛ රෝගය ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින බවත්;

(ii) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව මෙම රෝගය වැළැක්වීමට දිය යුතු එන්නත් ප්‍රමාණවත්ව නොමැති බවත්;

(iii) එම රෝගය පාලනය කිරීම සම්බන්ධයෙන් උක්ත දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ චක්‍රලේඛයේ බොහෝ කරුණු අවලංගු කර තිබෙන බවත්; සහ

(iv) එසේ කිරීම හේතුවෙන් එම රෝගය පාලනය කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ චක්‍රලේඛයෙන් ඉවත් කළ කරුණු කවරේද;

(ii) එම කරුණු ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) නැවත එම කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) ගව කුර හා මුඛ රෝගය පාලනය කිරීමට අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබා දීමට ගනු ලබන පියවර කවරේද; සහ

(v) එම රෝගය නිසා විනාශ වන ගව සම්පත බෝ කිරීමට ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

174/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.06.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවීමට අදාළ අනුමතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති බවත්; සහ

(ii) ඉහත අනුමතිය ප්‍රකාරව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2015.07.17 දිනැති අංක ED/4/58/16/01/04 දරන ලිපියෙන්, විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් නැවත සේවයේ යොදවන මෙන් අදාළ සියලු පාර්ශ්වයන් වෙත උපදෙස් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 සැප්තැම්බර් 01 දින වනවිට, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා අයදුම් කර ඇති විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ නම් කවරේද; සහ

(ii) ඔවුන් විධිමත් ලෙස නැවත සේවයේ පිහිටුවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ මහ නගර සභා ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණයේ සවිකර තිබූ පැරණි අකුණු සන්නායක තුනේ හුගත කම්බි හා මාතලේ නගර මධ්‍යයේ පිහිටි පැරණි ඔරලෝසු කනුවේ ඔරලෝසුවක කොටස් අතුරුදන්වී ඇති බවත්; සහ

(ii) අතුරුදහන්ව ඇති එම කොටස්වල පෞරාණික වටිනාකමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සිදුවීම් සම්බන්ධව පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එම පැමිණිලි ලද දිනයන් කවරේද;

(iii) පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද;

(iv) එම පැමිණිලි විභාග කළ දිනයන් කවරේද;

(v) එම විභාගයන් සිදු කළ නිලධාරීන් කවුරුන්ද;

(vi) එකී පැමිණිලිවලට සම්බන්ධ වූදිතයන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කර තිබේද; සහ

(vii) එසේ නම්, එම වූදිතයන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 30 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

72/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ, කටුනායක - කොළඹ සහ පිටත වටරවුම් යන අධිවේගී මාර්ග හේතුවෙන් කුඹුරු ඉඩම්, තෙත්බිම් හා ගංගා පිටාර තැනි ආදියට හානි සිදු වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ගංවතුර තර්ජනයකට අධිවේගී මාර්ග අවට ජනයා මුහුණ දී සිටින බවත්; සහ

(iii) මෙම පරිසර හානිය සමස්ත රටේම පරිසර තුලිතතාවට බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අධිවේගී මාර්ග හේතුවෙන් ගංවතුර තර්ජනයට ලක් වී තිබෙන ප්‍රදේශ එම තර්ජනයෙන් මුදා ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) හානියට ලක් වූ පරිසර පද්ධතීන් සංරක්ෂණයට එතුමා පියවර ගෙන තිබේද; සහ

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (ii)හි සඳහන් ගංවතුර තර්ජනය හා සම්බන්ධ වන අනෙකුත් අමාත්‍යාංශ සමග ඒකාබද්ධ වැඩසටහනක් තිබේද; සහ

(ii) එසේ නම්, එම වැඩසටහන කුමක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

170/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 අතර කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් සහ ග්‍රාමීය ක්‍රීඩාපිටි වැඩිදියුණු කිරීම සඳහා මුදල් වෙන්කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(iii) දිස්ත්‍රික්කය පුරා එම මුදලින් ඉදිකළ ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ක්‍රීඩාපිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(v) ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් වෙන් කර වැඩ අවසන් වූ ක්‍රීඩාපිටි තිබේද;

(ii) එසේ නම්, ඒවා කොට්ඨාස අනුව කවරේද;

(iii) වැඩ අවසන් නොවී ඇති ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ වැඩ අවසන් කිරීමට තවදුරටත් අවශ්‍ය වන මුදල කොපමණද;

(v) එම මුදල් ලබා දීමට කටයුතු කරන්නේද; සහ

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.25 දින කොළඹ වරායට නුදුරු මුහුදෙහි පිහිටි බොර තෙල් ප්‍රවාහනය කරන නළය අබලන් වීම නිසා බොර තෙල් ප්‍රවාහනය කරන නෞකා සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වූ නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නෞකාවට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නළය අලුත්වැඩියා කිරීමට ගත වූ දින ගණන කොපමණද;

(iv) මේ හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්පූර්ණයෙන් වසා තැබීමට සිදු වූ දින ගණන කොපමණද; සහ

(v) ඉන්ධන ප්‍රවාහන නළයට සිදු වූ මෙම හානිය හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ සමස්ත අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝයාවට අවශ්‍ය නළ මිලදී ගැනීමට අවසන් වරට ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ දිනය කවරේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා එම සමාගම් අයත් රටවල් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාදුන් සමාගම කුමක්ද; සහ

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

175/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති රාශියක් 2015 ජනවාරි මස සිට නතරකර දමා ඇති බවත්; සහ

(ii) මෙම වසර තුළ පැවැත්වූ එකම දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී ඒවා නැවත ආරම්භ කරන බව රජයේ දේශපාලනඥයින් හා නිලධාරීන් අවධාරණය කරනු ලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වෙහෙරහේන රජමහා විහාරයේ, දෙව්නුවර රජමහා විහාරයේ සහ වැවුරුකන්නල පූජා භූමියේ අතරමග නවතා දමා ඇති ඉදිකිරීම් නැවත ආරම්භ කරන්නේද; සහ

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

74/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පතක් නොමැති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට ක්‍රියා නොකළේ මන්ද;

(iii) එම පිරිසට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද; සහ

(v) එම හැඳුනුම්පත් නිකුත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට රජය කටයුතු කරමින් සිටින්නේද;

(ii) එසේ නම්, වයස අවුරුදු 18 ඉක්මවූ සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ට හැඳුනුම්පතක් ලබා දීමට එම ක්‍රමය යටතේ හැකිවේද;

(iii) ඒ සඳහා ඇති සැලසුම් කවරේද;

(iv) එම නව ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට බලාපොරොත්තුවන මුදල කොපමණද; සහ

(v) නව හැඳුනුම්පත සඳහා ජනතාවගෙන් මුදලක් අයකරගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 01 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

75/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව ඇති නොදියුණු තාක්ෂණික උපකරණ මගින් නිවැරදි කාලගුණ අනාවැකි ලබා දීමට අපොහොසත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මානව හා දියුණු භෞතික සම්පත් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ලබා දීමට බලාපොරොත්තු වන නවීන තාක්ෂණික උපකරණ කවරේද;

(iii) එම නවීන උපකරණ කුමන කටයුතු සඳහා භාවිතා කරන්නේද;

(iv) එම උපකරණ සඳහා වැය වන මුදල කොපමණද; සහ

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

154/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි මස 10 දින සිට 2015 සැප්තැම්බර් මස 30 දින දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට හා රජයට අනුබද්ධ ආයතනවලට බඳවා ගනු ලැබූ සේවක සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් කාලය තුළ බඳවාගත් සේවකයින් සංඛ්‍යාව අදාළ ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පිරිස ආයතනගත කරනු ලැබූ පදනම කවරේද;

(iii) ස්ථිර, අනියම් සහ කොන්ත්‍රාත් යන පදනම් අනුව බඳවාගත් සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (අ) හි සඳහන් පිරිස අතරින් 2015 ජූනි මස 28 දිනට පසුව බඳවා ගනු ලැබූ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අයත් වන ආයතන කවරේද; සහ

(vi) එම සේවකයින් සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ)හි සඳහන් කාල පරිච්ඡේදය තුළ සියලු බඳවාගැනීම් සිදු කරනු ලැබුවේ තරඟ විභාගයකින්ද; නැතහොත්, සම්මුඛ පරීක්ෂණයකින්ද; යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී එප්පාවල පොස්පේට් සමාගම් භූමියේ මීටර් 850 ක මාර්ගය කාපට් ඇතිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) ටෙන්ඩරය ලබා දුන් සමාගම කුමක්ද; සහ

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක, අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් හා ටෙන්ඩරයේ වටිනාකම එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එප්පාවල පොස්පේට් සමාගම තුළ සිදුවූ දූෂණ හා වංචා පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

(iv) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද; සහ

(vi) එම පරීක්ෂණයේ ප්‍රතිඵල මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 02 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.07.01 දින සිට ආනයනය තහනම් කරනු ලැබූ ආහාර සඳහා යොදන රසකාරක වර්ග කවරේද; සහ

(ii) එම එක් එක් රසකාරක වර්ගය, තහනම් කිරීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තහනම් කළ රසකාරක මෙන්ම, අජිනමොටෝ නොහොත් මොනෝසෝඩියම් ග්ලූටමේට්(MSG) රසකාරකය ද මිනිස් සිරුරට අහිතකර බවත්;

(ii) එය පිළිකා, ස්නායු ආබාධ ඇතුළු දරුණු රෝගාබාධ සඳහා හේතු කාරක වන බවත්; සහ

(iii) වසරකට එම රසකාරක මෙට්‍රික් ටොන් 2200කට වැඩි ප්‍රමාණයක් මෙරටට ආනයනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මොනෝසෝඩියම් ග්ලූටමේට් භාවිතය තහනම් කිරීමට කටයුතු කරන්නේද; සහ

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු හා කර්මාන්තශාලා සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වතු හා කර්මාන්තශාලාවන්ගේ නම්, පිහිටි ප්‍රදේශ හා වගා කර ඇති බෝග වර්ග මොනවාද;

(ii) එම එක් එක් වත්තේ සහ කර්මාන්තශාලාව ආශ්‍රිතව සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ ඉහත වතු හා කර්මාන්තශාලා අතරින් ලාභ ලැබූ හා පාඩු ලැබූ වතු හා කර්මාන්තශාලා මොනවාද; සහ

(iv) එකී කාල සීමාව තුළ දී එම එක් එක් වත්ත හෝ කර්මාන්තශාලාව ලැබූ ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) පාඩු ලැබූ රාජ්‍ය වතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් ලබා දුන් වතු හා කර්මාන්තශාලා කවරේද;

(iv) පාඩු ලබන රාජ්‍ය වතු නගා සිටුවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද; සහ

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විගණකාධිපති වාර්තා අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව හා නොසැලකිලිමත්භාවය හේතුවෙන් රජයට අහිමි වී ඇති මුදල රුපියල් බිලියන 388ක් බවත්;

(ii) මෙම මුදලට වැට් බදු මුදල් වංචාවේ රුපියල් බිලියන 3.9ක මුදලද ඇතුළත් බවත්;

(iii) ඒ අනුව වැට් බදු වංචාවෙන් රජයට අහිමි වූ මුදල, රජයට අහිමි වූ සමස්ත මුදලෙන් ආසන්න වශයෙන් 0.5% ක් පමණක් වන බවත්; සහ

(iv) ඉතිරි 99.5% පිළිබඳව මෙතෙක් පරීක්ෂණ සිදු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැට් බදු මුදල් වංචාව හැරුණු කොට ඉතිරි රුපියල් බිලියන 384.1ක් රජයට අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් පිළිබඳව විමර්ශනය කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම් කවරේද; සහ

(iii) මෙම පුද්ගලයන් සම්බන්ධව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

99/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දෙකක කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්හි විශාල වන සංහාරයක් සිදු වී ඇති බවත්;

(ii) එම වන සංහාරයට සෘජුවම දේශපාලන මැදිහත්වීම් ඇති බවත්;

(iii) එම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිහඬව සිටින බවත්; සහ

(iv) මෙම වන සංහාරය ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියට මෙන්ම, දේශගුණ විපර්යාසයන්ටද සෘජුවම බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර දෙපළාතට අයත් රක්ෂිත වනාන්තර කවරේද;

(ii) එම වනාන්තරයන්හි විශාලත්වය එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) උක්ත වනාන්තර රක්ෂිත බවට පත් කළ වර්ෂය එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර දෙක තුළ ඉහත වනාන්තර ප්‍රදේශ තනිව හෝ කණ්ඩායම් වශයෙන් එළිකිරීම සම්බන්ධව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග, එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලහත්කාරයෙන් අල්ලා ගත් උතුරු හා නැගෙනහිර දෙපළාතේ රක්ෂිතයන්ට අයත් ඉඩම් නැවත පවරා ගැනීමට පියවර ගන්නේද; සහ

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 04 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.01 වැනි දින පුරප්පාඩු වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ ක්‍රමවේදය කවරේද;

(ii) උක්ත තනතුර දැරීමට සම්පූර්ණ කළ යුතු, අධ්‍යාපන හා රාජ්‍ය සේවයේ නියමිත මූලික සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014.06.02 වැනි දින ඉහත තනතුරට තාවකාලික පදනමින් අනුයුක්ත කළ ඉන්ද්‍රාණි මංගලිකා වික්‍රමනායක යන නිලධාරිනියගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඇය 2003.03.03 වැනි දින සිට 2013.02.11 වැනි දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ කෙතරම් කාලයක් සේවය කර තිබේද; සහ

(v) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කළ යුත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිලධාරිනියට එරෙහිව මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක් සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි නිලධාරිනියකට අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලබා දීමේ නීත්‍යානුකූල පදනම කවරේද;

(iii) අදාළ පත්වීම බල රහිත කිරීමට පියවර ගන්නේද; සහ

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්; සහ

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද; සහ

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වනවිට දේශීය පැරණි වී වර්ග, බීජ වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බීජ වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද; සහ

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 05 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගංගා ආශ්‍රිතව අනවසර වැලි ගොඩ දැමීම්, මැණික් ගැරීම් හා රත්රන් කැණීම් සිදුවන බවත්;

(ii) මේ නිසා එම ගංගාවන්ට විශාල වශයෙන් හානි සිදුවන බවත්;

(iii) එය ජන ජීවිතයට ද සෘජුව බලපාන බවත්; සහ

(iv) අදාළ ආයතන තුළ එම අකටයුතුකම් වැළැක්වීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගා ආශ්‍රිතව සිදුවන උක්ත අකටයුතුකම් මැඩලීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවරයන් කවරේද;

(iii) 2013.01.01 වැනි දින සිට 2014.06.30 වැනි දින දක්වා (අ) (i)හි සඳහන් වැරදි පිළිබඳ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද; සහ

(iv) ඒ සම්බන්ධව ගත් නීති ක්‍රියාමාර්ග එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත පරිසර හානි මැඩලීමට දැනට පවත්නා නීති පද්ධතිය ප්‍රමාණවත් වන්නේද; සහ

(ii) නොඑසේ නම්, පවතින නීති වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

142/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 ගිණුම් වර්ෂය තුළ අලාභ ලැබූ රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ආයතනයන්හි අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත (i) හි සඳහන් ආයතනයන්ගෙන් වෙනත් රාජ්‍ය ආයතනයන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලාභ පියවීම සඳහා උක්ත ආයතනයන්ට මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ මුදල් ප්‍රමාණය එක් එක් ආයතනයන්ට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත අලාභයන්ට හේතු පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම හේතු එක් එක් ආයතනයට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත ආයතනයන් ලාභදායී ආයතන බවට පත්කිරීමට පියවර ගන්නේද; සහ

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.6/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.7/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.8/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,— රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10 /'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සහා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන

බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත්

ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැළපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතිත බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි

විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින්

තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රීක විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙලීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙලීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.90/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.91/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.92/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.93/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.94/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.95/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රිය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රිය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.96/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.97/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.98/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.99/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.100/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.101/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.102/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පළිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.103/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.104/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරිත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.121/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.